www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බංග්ලාදේශ් හමුදා විරෝධතා උද්ඝෝෂනයේ යෙදුන කම්කරුවෝ දෙදෙනෙකු ඝාතනය කරති

## Security forces kill two protesting workers in Bangladesh

**විමල් පෙරේරා විසිනි**

**2009 ජූලි 10**

වැඩ වර්ජනයේ යෙදී සිටි කම්කරුවන් දෙදෙනකු පොලීසිය සහ පැරා මිලිටරි අන්සර් භටයන් විසින් ජූනි මස 27 සහ 28 වෙඩි තබා ඝාතනය කිරීමෙන් අනතුරුව විරෝධතාවයේ යෙදී සිටින බංග්ලාදේශ් ඇඟලුම් කම්කරුවන්ට එරෙහිව පූර්න කඩාපැනීමක් අගමැති ෂීක් හසීනා වජිඩ්ගේ ආන්ඩුව දියත් කර ඇත. වෙඩි පහර වලින් 150 ක් තුවාල ලැබූ අතර මොවුන්ගෙන් 6 ගේ තත්ත්වය බරපතලය. සිය ගනනක් අත් අඩංගුවට ගෙන ඇති අතර දහස් ගනනකට එරෙහිව චෝදනා ගොනු කරනු ලැබ තිබේ.

මෙම හිංසාකාරී ප්‍රහාරවලින් පෙන්නුම් කරන්නේ, ජනතා හිතකාමී යයි සාවද්‍ය ලෙස ප්‍රකාශ කරන අවාමි ලීග් ආන්ඩුව භූගෝලීය අවපාතය රට කෙරෙහි අහිතකර ලෙස බලපාන තත්ත්වය යටතේ කම්කරුවන්ගේ නොසන්සුන්තාවන් ඉවසා සිටීමට නුසුදානම් බවය. බංග්ලාදේශයේ ආර්ථිකය බොහෝ සෙයින් රැඳී ඇත්තේ අධික සූරාකෑමක් යටතේ නිෂ්පාදනය කර අපනයනය කරන ඇඟලුම් කර්මාන්තය මතය.

ජම්ගාරා හි පිහිටි ශීත කබා නිෂ්පාදන කම්හලක් වන එස්. සුහි ඉන්ඩස්ට්‍රියල් පාක් ලිමිටඩ් හි කම්කරුවෝ වැටුප් වැඩි කරන ලෙස ඉල්ලා දින කිහිපයක් උද්ඝෝෂනයක නිරත වීමෙන් අනතුරුව ජූනි මස 27 දා නැවතත් කම්හල වෙත පැමිනියහ. ගැටුම් ආරම්භ වූයේ ඉන්පසුව ය. උද්ඝෝෂන මෙහෙයවීමේ චෝදනා මත නායකයින් 3ක් නෙරපා දැමූ බව ඔවුන්ට දැන ගැනීමට ලැබුනි. සිය ගනනක් කම්කරුවෝ ක්ෂනිකව ම ඔවුහු යලි සේවයේ පිහිටු වන ලෙස ඉල්ලමින් උද්ඝෝෂනය කලහ. පොලීසිය විරෝධතාවය බිඳීම සඳහා කම්කරුවන්ට වෙඩි තැබීය. ප්‍රහාරයෙන් 26 හැවිරිදි අල් අමින් නම් කම්කරුවා මරනයට පත් විය.

කුපිත වූ කම්කරුවෝ කම්හල් පරිශ්‍රයට පහර දෙමින් ද, වෑන් රථයටකට ගිනි තබමින් ද, ඩකා-තන්ගයිල් මහා මාර්ගය අවහිර කරමින් හා වාහන කිහිපයකට අලාභ හානි සිදු කරමින් ඊට ප්‍රතිචාර දැක්වූහ. උද්ඝෝෂනය පැතිරී යාමේ භීතියෙන් අවට කම්හල් ගනනාවක් වසා දැමූ නමුත් කම්කරුවෝ බොහෝමයක් විරෝධතාවලට සහභාගි වූහ.

ජම්ගාරා ප්‍රදේශයේ කම්හල් වල හිමිකරුවන් විසින් ජූනි මස 28 නිවාඩු දිනයක් ලෙස නිවේදනය කල ද වැඩිපුර කම්කරු සංඛ්‍යාවක් අරගලයට සහභාගි වූහ. අල් අමින් ඝාතනය කල අන්සර් භටයන්ට දඬුවම් කරන ලෙසත් ඔහුගේ පවුලට වන්දි ගෙවන ලෙස ඉල්ලා සිටිමින් කම්කරුවෝ අෂුලිය-ටොන්ගි පාර අවහිර කලහ.

පොලීසිය සහ ක්ෂනික ක්‍රියාන්විත බලකායේ (Rapid Action Battalion) නිලධාරීහු ඩකා අපනයන පිරිසැකසුම් කලාපය වෙත ඇදෙමින් පැවැති දහස් සංඛ්‍යාත කම්කරුවන්ගේ පෙලපාලියක් අවහිර කලහ. නිව් ඒජ් මාධ්‍යයට අනුව, ඔවුන්ට පහර දීම සඳහා අවාමි ලීගයේ ප්‍රාදේශීය නායකයෙක් මැර කන්ඩායමක් සමග ගිය විට, කම්කරුවෝ කඩා පැන ඇඟලුම් කම්හල් ගනනාවක් කොල්ලකෑහ.

තවත් කම්කරුවෙකු ඝාතනය කරමින් සහ 100 අධික පිරිසක් තුවාල කරමින් පොලීසිය පෙලපාලි කරුවන්ට බැටන් පොලු, රබර් උන්ඩ හා කඳුලු ගෑස් ප්‍රහාර එල්ල කලේය. බරපතල ලෙස තුවාල වලට ගොදුරු වූවන් අතර ජුගන්තොර් දිනපතා පුවත් පතේ මාධ්‍යකරු ජාවිඩ් මොස්තාෆ ද සිටියේ ය.

කම්කරුවන්ගේ කෝපය අවමංගත කිරීම සඳහා, වෙඩි තැබීම් වලට හවුල් වූවා යයි පිලිගත් අන්සර් සාමාජිකයින් කිහිප දෙනෙකු පොලීසිය අත් අඩංගුවට ගත්තේය. කෙසේ හෝ ඔවුන්ගෙන් 3 පමනක් උසාවියට ඉදිරිපත් කල අතර සෙසු අය නිදහස් කලේ ය.

ජූනි මස 29 දින අතිරේක රාජ්‍ය භටයින් 3,000 ට මුහුන දෙමින් 50,000 අධික කම්කරුවෝ

විරෝධතාවන්ට සහභාගි වූහ. ආන්ඩුව පරීක්ෂන කල යුතු බවත් ඝාතනවලට වග කිවයුත්තන්ට දඬුවම් කරන ලෙස හා මරනවලට ගොදුරු වූ කම්කරු පවුල් වලට වන්දි ගෙවන ලෙස විරෝධතා දිනය අවසානයේ දී නායකයෝ ඉල්ලා සිටියහ.

එහෙත්, විරෝධතා වලට සහභාගි වූවන්ට එරෙහි ව දැඩි ක්‍රියාමාර්ග ගන්නා බවට කම්කරු ඇමති ඛන්දකර් මොෂරෆ් හොසෙයින් අනතුරු ඇඟවූයේ ය. විනාශකාරී ක්‍රියා සහ ගිනි තැබීමේ චෝදනා මත එස් සුහි ඉන්ඩස්ට්‍රියල් පාක් හි ඇඟලුම් කම්කරුවන් 15 පොලීසිය විසින් ජූනි 02 අත් අඩංගුවට ගත්තේය.

ආන්ඩුව කම්කරුවන්ට එරෙහිව ''යකඩ හස්තයකින්'' ප්‍රතිරෝධ දැක්විය යුතු බව ජූලි මස 4 දින, කර්මාන්ත ඇමති ඩිලිප් බරුඅ ප්‍රකාශ කලේය. පසු දින, පොලීසිය 5,000 - 6,000 අතර කම්කරු සංඛ්‍යාවකට එරෙහිව නඩු ගොනු කලේය. නායකයන්, වෘත්තීය සමිති සහ ප්‍රධාන විපක්ෂය වන බංග්ලාදේශ් ජාතිකවාදී පක්ෂයේ (බීඑන්පී) ක්‍රියාකාරීහු 38 ද ඊට ඇතුලත් වූහ.

නොසන්සුන්තාවය රට අස්ථාවර කිරීම සඳහා කුමන්ත්‍රනයක කොටසක් ලෙස යම් කන්ඩායමක ගේ වැඩක් බව බරුඅ ප්‍රකාශ කලේ ය. කැරලිවලට "තරගකාරී රටවලින්" මුදල් සම්පාදනය කල බව බංග්ලාදේශ් ඇඟලුම් නිෂ්පාදනය සහ අපනයන සංගමයයේ (බීජීඑම්ඊඒ) නියෝජ්‍ය සභාපති ෂනිඋල් ඉස්ලාම් පැවසුවේය.

2006 මැයි මස, ඩකාවලට උතුරෙන් පිහිටි සවාර් අපනයන පිරිසැකසුම් කලාපයේ දහස් සංඛ්‍යාත කම්කරුවන් පොලීසිය සහ අන්සාර් භටයන් සමග ගැටුනු විට, එවකට පැවැති පාලක බීඑන්පීය සහ ඇඟලුම් සේවාදායකයෝ මෙවැනි ම චෝදනා ඉදිරිපත් කලහ.

සත්‍යය නම් ලෝක අවපාතයෙහි බලපෑම යටතේ, තක්සේරු ගත මිලියන 1.8 ක් වැඩකරන, බහුතරයක් කාන්තාවන් වන ඇඟලුම් කර්මාන්ත කම්කරුවන්ගේ ජීවන සහ වැඩ කොන්දේසි නරක අතට හැරෙමින් පවතින බව යි. බංග්ලාදේශ් සමාගම් දැවැන්ත ලෙස වැටුප් කපා දමමින් ලාභ පවත්වාගෙන යාමට උත්සහ කරයි. 2008 මුලදී මසකට ටකා 10,500 (ඇ.ඩො.150) පමන ඉපයූ පුහුනු කම්කරුවන්ගේ වැටුප සියයට 30 කින් කප්පාදු කර ඇත.

බංග්ලාදේශයේ අපනයනයන්ගෙන් සියයට 80 ක නිපදවන ඇඟලුම් කම්හල් කාර්මික ශ්‍රම බලකායෙන් සියයට 40 ක් සේවයෙහි යොදවා ඇත. චීනයට පසුව දෙවන විශාලතම අපනයන කරුවා බවට පත්කරමින් බංගලිදේශය 2008 වසරේ ජූනි වන විට ඇඟලුම් අපනයන වලින් ඇ.ඩො. බිලියන 11 ක් ඉපයී ය. ඇමරිකාවේ සහ යුරෝපයේ අර්බුදකාරී තත්ත්වය නිසා, හැකිළී යන ඇනවුම් හේතුවෙන්, තම ප්‍රතිමල්ලවයින් වන පකිස්ථානය ඉංදියාව, ශ්‍රී ලංකාව සහ චීනය සමග බංග්ලාදේශ් සේවායෝජකයෝ එකිනෙකාගේ බෙලි කපා ගන්නා තරගයක නිරතව සිටිති. නොවැම්බර් මාසයේ සිට නිමි ඇඟලුම් කර්මාන්තයේ සියයට 40 වර්ධනය සියයට 2-3 මට්ටමකට වැටී ඇත.

වසර දෙකකට පෙර ඇඟලුම් කම්කරුවකු ලෙස වැඩ කිරීමට පටන් ගත් දහ අට හැවිරිදි මොහොමඩ් කමලුද්දින්ට දැකගත හැකි වූයේ ඔහුගේ මාසික වැටුප ටකා 7,000 (ඇ.ඩො 100) සිට 3,000 දක්වා එනම් අඩකටත් වඩා අඩුවී ඇති බව ය. ඒ.එෆ්.පී මාධ්‍යයට ඔහු පැවසුවේ: "ඉහත දී එය දරාගත හැකි වුනා. මොකද මා මාසයකට ටකා 3,000 අම්මට යැවුවා. දැන් මට යන්තම් ජීවත්වීමට පමනයි සෑහෙන්නෙ."

පසුගිය සතියේ නිකුත් කල කර්මාන්ත පරීක්ෂන දෙපාර්තමේන්තු වාර්තාවකට අනුව, ජනවාරි සහ මැයි අතර සමීක්ෂනයට ලක් කරන ලද කර්මාන්ත ශාලා 825 න් 122 මාසික අවම වැටුප වන ඇ.ඩො. 25 ගෙවීම පැහැර හැරීම ඇතුලුව සේවකයින්ට නියමිත වේලාවට වැටුප් ගෙවා නැත.

කම්කරුවන්ගේ සේවා කොන්දේසි කප්පාදු කිරීම සඳහා ආන්ඩුව සමාගම් වලට උදව් කරයි. බී.ජී.එම්.ඊ.ඒ හි සභාපති අබ්දුල් සලම් මුර්ෂෙදි සමග ජූලි මස 4 පැවැත් වූ රැස්වීමක දී අගමැතිගේ උපදේශක, සයිඩ් මුර්සෙඩ් අලි, වානිජ ඇමති ෆාරුක් ඛාන් සහ ඩකා දිස්ත්‍රික්ක පොලිස් අධිකාරී ඉක්බාල් බහාර් කම්හල්වලත් ඒවාහි සිටින කරුවන්ගෙත් ආරක්ෂාව පිනිස ඔත්තු බැලීමේ කටයුතු වැඩි දියුනු කිරීම ගැන යෝජනා කලහ. ආන්ඩුව විශේෂඥ කර්මාන්ත පොලිස් ඒකකයක් පිහිටුවීම ගැන ද සලකා බලමින් සිටියි.

කම්කරුවන් සහ ග්‍රාමීය දුගීන්ට රැකියා, වැඩි වැටුප්, සහ සුභ සාධන වැඩ පිලිවෙලවල් ගැන පොරොන්දු දෙමින් මාස 6 ට පෙර ෂීක් හසීනාගේ ආන්ඩුව බලයට පැමිනියේ ය. යහපත් සමාජ තත්ත්වයක් සඳහා බලාපොරොත්තු ඇතිව සහ පෙර පැවැති හමුදා පිටුබලය සහිත ආන්ඩුවට ඇති විරෝධය ප්‍රකාශ කරමින්, වැඩ කරන ජනතාව අවාමි ලීගයට අති විශාල වශයෙන් ඡන්දය දුන්හ. ඒ කෙසේ වෙතත්, සති දෙකකට පෙරාතුව ඉදිරිපත් කෙරුනු හසීනාගේ ප්‍රථම අයවැයෙන් මාසික අවම වැටුප ඇ.ඩො. 24 සිට 72 දක්වා වැඩිකිරීමේ කම්කරුවන්ගේ ඉල්ලීම නොතකා හරින ලද අතර, සමාගම් සඳහා ඇ.ඩො. මිලියන 725 ක උත්තේජක පැකේජයකට මුදල් වෙන් කලේය.

© www.wsws.org